# පොලිස්පති නිල කාර්යාලය

**RTM - 213** **CRTM - 199** 2024.02.8

පොලිස්පති ගෙන්,

සියළුම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන්
: නියෝජ්‍ය පොලිස්පති වරුන්
: අණදෙන නිලධාරීන්
: කොට්ඨාස භාර නිලධාරීන් / අධ්‍යක්‍ෂ වරුන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධාරීන්
: මූ.පො.ප /ස්ථානාධිපති වරුන්

**කල්බදු (Leasing) සමාගම් සහ මූල්‍ය (Finance) සමාගම් මගින් වාහන අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දී පොලිස් නිලධරයන්ගේ කාර්යභාරය**

වාහන ඇතුළු කල්බදු මූල්‍යකරණයට යටත් කර ඇති උපකරණයක සන්තකය ලබා ගැනීම සඳහා බදු දීමනාකරු වන කල්බදු සමාගම් සහ මූල්‍ය සමාගම් විසින් ඒ පිළිබඳව ක්‍රියා කල යුතු ආකාරය පිළිබද නෛතික විධිවිධාන 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 27 වගන්තියේ ඇතුලත්ව ඇත.

මෙම පනතේ නෛතික ප්‍රතිපාදන වලට අනුව පොලිස් නිලධරයන් ක්‍රියා කල යුතු ආකාරය පිළිබදව මෙයට පෙර අවස්ථා කිහිපයක දී (2021.01.31 දිනැති ආර්ටීඑම් 557 හා 2022.12.19 දිනැති ආර්ටීඑම් 481) නිලධරයන් දැනුවත් කිරීමට කටයුතු කල ද, බොහොමයක් අවස්ථා වල දී නිලධරයන් විසින් එම නෛතික ප්‍රතිපාදන අනුව ක්‍රියා නොකරන බවට පැමිණිලි ලැබී ඇත.

එබැවින් පනතේ නෛතික ප්‍රතිපාදන කෙරෙහි නැවත ඔබගේ අවධානය යොමු කල යුතු අතර, ඒ අනුව ක්‍රියා කරන ලෙසට නිලධරයන් දැනුවත් කල යුතු ය.

පනතේ 27 වගන්තිය පහත පරිදි වේ,

*" මේ පනත යටතේ හෝ කල්බදු මූල්‍යකරණයක විධිවිධානයක් යටතේ, උපකරණයක සන්තකය ලබා ගැනීමට හිමිකම් ලබන්නා වූ බදු දීමනාකරුවකු විසින්,*

*(අ). උපකරණය ඇත්තා වූ ප්‍රදේශය තුල පිහිටි පොලිස් ස්ථානය භාර නිලධාරියා වෙත ඒ අයිතිවාසිකම පිළිබදව දැනුම් දෙනු ලැබීම,*

*(ආ) ඒ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ දී සාමය කඩවීමක් වළක්වාලීම සඳහා ඒ පොලිස් ස්ථානයේ පොලිස් නිලධරයකුගේ සහාය ලබා ගැනීම ; සහ*

*(ඇ) උපකරණයේ සන්තකය, ඇති තැනැත්තාගෙන් ප්‍රතිරෝධය පෑමක් නොමැතිව ලබා ගැනීමට හෝ යම් විශේෂ තැනැත්තෙකුගේ සන්තකයේ එය නොමැති අවස්ථාවක, යම් තැනැත්තෙකුගේ ප්‍රතිරෝධය පෑමක් නොමැති ව හෝ එය ලබා ගත හැකි නම්, උපකරණය ඇති ස්ථානයේ එහි සන්තකය නැවත ලබා ගැනීම,*

*කළ හැකිය "*

මේ අනුව කල්බදු මූල්‍යකරණ පනත යටතේ උපකරණයක සන්තකය ලබා ගැනීමේ දී බදු දීමනාකරු විසින් අදාල පොලිස් ස්ථානය භාර නිලධාරියා වෙත පෙර දැනුම් දීමක් සිදු කල හැකි ය.

එලෙස බදු දීමනාකරු විසින් පොලිස් ස්ථානය වෙත දැනුම් දීමක් සිදු කිරීමේ දී තොරතුරු සටහන් පොතෙහි එම ප්‍රකාශය සටහන් කිරීම හෝ ලිඛිත ප්‍රකාශයක් නම් එය තොරතුරු පොතෙහි ඇලවීමට පියවර ගැනීම කළ යුතු ය.

තවද පනතේ 27 වගන්තිය ප්‍රකාරව බදු දීමනාකරු විසින් පොලිස් ස්ථානය වෙත දැනුම්දීමක් කරන අවස්ථාවක දී සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයන්ගේ ආරක්ෂාව ලබා දිය යුතු ය.

තවද ඉහත නෛතික ප්‍රතිපාදන අනුව, අදාල උපකරණයේ සන්තකය ලබා ගැනීමට බදු දීමනාකරුට හැකියාව ලැබෙන්නේ අදාල තැනැත්තාගේ ප්‍රතිරෝධයක් නොමැති නම් පමණි.

එලෙස උපකරණයේ සන්තකය ලබා ගැනීමක දී ප්‍රතිරෝධය පෑමක් එල්ල වන විට බදු දීමනකාරු විසින් සිදු කල යුතු වන්නේ පනතේ 28 වගන්තියේ දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව දිසා අධිකරණය ඉදිරියේ ඒ සඳහා නඩුවක් පවරා ගැනීමයි.

බදු දීමනාකරු විසින් පනතේ 27 සහ 28 වගන්ති වල දක්වා ඇති ප්‍රතිපාදන වලට පටහැනිව ක්‍රියා කිරීම පනතේ 39 වගන්තිය යටතේ වරදක් වන අතර, ඒ පිළිබඳව දඬුවම පනතේ 41 (1) උප. වගන්තියෙහි දක්වා ඇත.

තවද ඉහත පරිදි සිදු කරන විමර්ශනයක දී වෙනත් වරදක් **(කොල්ලකෑම, සොරකම, සාපරාධී අයුතු ඇතුළුවීම ආදී )** අනාවරණය වූ විට ඒ පිළිබඳව ද නෛතික ක්‍රියාමාර්ග ගැනීම සිදු කල යුතු ය.

එමෙන්ම ඉහත දක්වා ඇති ප්‍රතිපාදන අනුව පොලිස් නිලධරයන් විසින් මැදිහත් වීමක් සිදු කල යුතු වන්නේ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ වූ කල්බදු ගිවිසුමක් (Leasing Agreement) සම්බන්ධයෙන් පමණක් බවද, 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ වූ කුලී සින්නක්කර ගිවිසුමක් (Hire Purchase Agreement) සම්බන්ධයෙන් එලෙස මැදිහත් වීමට ප්‍රතිපාදන නොමැති බවද වැඩිදුරටත් දන්වමි.

මේ අනුව අදාල බදු දීමනාකරු ගෙන් එම ගිවිසුමේ හෝ අත්පත් කර ගැනීමේ නියෝගයේ පිටපතක් ලබා ගෙන පරීක්‍ෂා කර බලා එය කල්බදු ගිවිසුමක් බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව ඉහත දක්වා ඇති නෛතික ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කල යුතු ය.

ඉහත ප්‍රතිපාදන වලට පටහැනිව වාහන / උපකරණ අත්පත් කර ගත් අවස්ථා වල දී ඒ පිළිබඳව බදු ගැනුම්කරුවන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි භාරගෙන නිසි විමර්ශනයක් සිදු කර නෛතික ක්‍රියාමාර්ග ගත යුතු බවත් අවධාරණය කරමි.

දේශබන්දු තෙන්නකෝන්
වැඩබලන පොලිස්පති

**දේශබන්දු තෙන්නකෝන්**
**වැඩබලන පොලිස්පති**
**පොලිස් මූලස්ථානය**
**කොළඹ - 01**

පිටපත : ගොනුවට

89118